# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1422/23 – 2005 දෙසැම්බර් 09 වැනි සිකුරාදා – 2005.12.09

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### සංශෝධනය කිරීමයි

### ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

2005 නොවැම්බර් මස 14 වැනි සඳුදා දින අංක 1419/3 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ I කොටස : I ඡේදයෙහි* ආණ්ඩුවේ නිවේදන යටතේ පළ වූ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ තිබෙන මුද්‍රණ දෝෂයන් පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතුය *:*

2. නිර්වචනය යටතේ-

"අදාල ක්ෂේත්‍රය" යනුවෙන් අදහස් කරනුයේ ලේකම් විසින් අනුම කරන ලද ක්ෂේත්‍රයක් වේ යන්න,

"අදාල ක්ෂේත්‍රය" යනුවෙන් අදහස් කරනුයේ ලේකම් විසින් අනුමත කරන ලද ක්ෂේත්‍රයක් වේ ලෙස ද,

13. පන්තියට පත් කිරීම යන්න,

13. **II** පන්තියට පත් කිරීම ලෙස ද,

15. විශේෂ ශ්‍රේණියට පත් කිරීම - යටතේ

"(ඇ) විශේෂ ශ්‍රේණියට සුදුසුකම් ලැබීමට පූර්වාසන්න පත් අවුරුදු කාලය තුළදී වාර්ෂික කාර්ය සාධන ඇගැයීම් වාර්තාවන් හි " යන්න,

"(ඇ) විශේෂ ශ්‍රේණියට සුදුසුකම් ලැබීමට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළදී වාර්ෂික කාර්ය සාධන ඇගැයීම් වාර්තාවන් හි " ලෙස ද,

17. අන්තර් කාලීන විධිවිධාන - යටතේ

"(අ) (i) ව්‍යවස්ථාව රජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට සිව් වසරක් ඉක්ම ගිය පසුව 14 හා 15 යන ඡේදයන් හි සඳහන් වන උසස්වීම් ක්‍රම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය". යන්න.

"(අ) (i) ව්‍යවස්ථාව රජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට සිව් වසරක් ඉක්ම ගිය පසුව 14 හා 15 යන ඡේදයන් හි සඳහන් වන උසස්වීම් ක්‍රම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය". ලෙස ද,

18. (i) "සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම 7 (ඇ) වගන්තියට අනුකූලව " යන්න ;

(i) "සේවයේ විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම 17 (ඇ) වගන්තියට අනුකූලව" ලෙස ද,

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු ලැයිස්තුවේ

I පන්තිය - පළාත් සහා තනතුරු අවසානයේ මාතෘකාවක් ලෙස II පන්තිය ඇතුළත් විය යුතු ය. (*ගැසට් පිටු* අංකය - 21 **A**)

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු ලැයිස්තුවේ I පන්තිය යටතේ සඳහන් වන,

"අතිරේක ලේකම්වරුන් - සියළුම අමාත්‍යාංශයන්" යන්න,

"ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් - සියළුම අමාත්‍යාංශයන්" ලෙස ද,

සංශෝධනය විය යුතු ය.

එච්. ඩී. එල්. ගුණවර්ධන,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 46,
වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

12-598